# ස්‍යාමොපසම්පදාව හා නායක පදවි

## ආරම්භය

බෝධිසත්ත්ව ගුණෝපේත පිණ්ඩපාතික අසරණ සරණ සරණංකරාභිධාන සංඝරාජෝත්තමයාණන් වහන්සේ පහළ වූ යුගයේ ලක්දිව එකදු උපසම්පන්න භික්ෂූන් වහන්සේ නමක්වත් සොයා ගන්නට නොහැකි වුණි. මුන්වහන්සේ පහළ වීමට ප්‍රථම කෝට්ටේ යුගයේ ඇති වූ පෘතුග්‍රීසී ආක්‍රමණ නිසා ලක්දිව සිටි භික්ෂූන් වහන්සේලාට නොයෙක් වදහිංසාවන්ට මුහුණ දෙන්නට සිදුවූණි. ඒ අනුව මේ කාලයෙන් පසුව ලක්දිව උපසම්පදා වැනි විනය කර්ම පවා සිදු කරන්නට නොහැකි වූ බැවින් භික්ෂූන් වහන්සේලාගේ පිරිහීමක් දක්නට ලැබුණි. ඉන්පසු පිරිහී ගිය උපසම්පදාව නැවත ගොඩ නගන්නට ඉදිරිපත් වූයේ දෙවන විමලධර්මසූර්ය රජුය. ඒ අනුව ක්‍රි. ව. 1697 දී දෙවන විමලධර්මසූර්ය රජුගේ අනුග්‍රහයෙන් රක්ඛංග දේශයෙන් උපසම්පදා භික්ෂූන් වහන්සේලා වඩම්වාගෙන අවුත් මහනුවර පුෂ්පාරාමයේ වැඩ හිඳුවා ගැටඹේ තොටේදී භික්ෂූන් වහන්සේලා තිස්නමක් උපසම්පදා කොට කුල දරුවන් එකසිය විසි දෙනෙක් පැවිදි කරවා සිව් පසයෙන් උපස්ථාන කිරීම ආදි ශාසනික වශයෙන් තමන්ගෙන් ඉටු විය යුතු සේවාව සිදු කොට ඇත.[1] එහෙත් නොබෝ කලකින් ම එකී උපසම්පදාව පිරිහී ගියේ ඇතැම් භික්ෂූන් සාමණේර වීම හා උපැවිදි වීම නිසාය.[2] නිසි පරිදි උපසම්පදා ශීලය ආරක්ෂා කරගැනීමට අපොහොසත් වීම නිසා උන්වහන්සේ එසේ සාමණේර භූමියට පත්වීමට හෝ පැවිදි ජීවිතය මුළුමනින් ම අත්හරින්නට ඇතැයි සිතිය හැකිය. එසේම රක්ඛංග දේශයෙන් ගෙනා උපසම්පදාව නොබෝ කලකින් ම නැති වී යාමට තවත් ප්‍රබල හේතුවක් වන්නට ඇත්තේ ඒ කාලය තුළ ලක්දිව පැවති කුලභේදය හා ඥාති ශිෂ්‍ය ක්‍රමයත් බලපාන්නට ඇතැයි කොටගම වාචිස්සර හිමියෝ පෙන්වා දෙති.[3] පැවිද්ද පිළිබඳ ඇගයුම්වලින් ඉවත් වූ විට ගිහියන් අතර පවත්නා අන්දමේ ගිහි ඥාති පරම්පරාව උසස් කොට සැලකීම, වංශභේද ඉස්මතු වීම, පෞද්ගලික ධන පරිභෝගය වැනි අගෝචර ප්‍රතිපදාවන්ට භික්ෂූන් අබ්බැහි වීම පුදුමයක් නොවේ.

සඟ සසුන තුළ මෙවන් අවාසනාවන්ත පසුබිමක් පැවති යුගයක වැලිවිට සරණංකර නැමති උදාර පුරුෂයාණන් (ක්‍රි. 1697-1778) පහළ විය. සරණංකර හිමියන් සාමණේර පැවිද්ද ලබා ගත්තේ රක්ඛංග උපසම්පදාවේ දී උපසම්පත්තිය ලබා සිටි සූරියගොඩ කිත්සිරිමෙවන් රාජසුන්දර තෙරුන්ගෙනි.[4] උන්වහන්සේ පාලි භාෂාව ඉගෙන ගත්තේ රක්ඛංග උපසම්පදා කර්මයේ දී උපසම්පදාව ලබාගත් වටපුළුවේ මහතෙරුන්ගේ ගිහි ශිෂ්‍යයෙකු වූ ඒදඬුවවේ රාළහාමිගේ බෑණා වූ ලෙව්කේ රාළහාමිගෙන් හා වටපුළුවේ තෙරුන්ගේ ශිෂ්‍යයෙකු වූ පල්කුඹුරේ අත්ථදස්සී තෙරුන්ගෙනි.[5] තත්කාලීන ගණින්නාන්සේලාගේ දුෂ්ප්‍රතිපත්තිවලට එකඟ නොවූ සරණංකර

සාමණේරයෝ ප්‍රතිපත්තිකාමී අලුත් පැවිදි පිරිසක් ඇති කළහ. උන්වහන්සේගේ එම සමාගම හැඳින්වූයේ ''සිල්වත්තැන්'' සමාගම නමිනි. සිටිනාමළුවේ සිල්වත් තැන, කදිරාගොඩ සිල්වත් තැන, එලිපැන්ගමුවේ සිල්වත් තැන යන සිල්වතුන් සරණංකර හිමියන්ගේ ප්‍රධාන අනුගාමිකයෝ වූහ. අස්ගිරි-පෝයමළු විහාර දෙකට අයත් ගණින්නාන්සේලා විසින් අලුත් පිරිස හඳුන්වනු ලැබුවේ ''වැලිවිට උන්නාන්සේගේ සමාගම, සිල්වත් සමාගම වැනි නම්වලිනි. මෙම සිල්වතුන්ගේ සමාගමෙහි කුලගෝත්‍ර භේදයක්, පවුල් බලයක්, වංශ භේදයක් හෝ පළාත් භේදයක් නොවීය. සරණංකර හිමියන්ගේ ප්‍රතිපත්තිකාමීත්වය කෙරෙහි පැහැදුනු නොයෙක් දිශාවන්වලින් පැමිණි සැදැහැවත්හු දැන් සිල්වත් සමාගමට එක් වී සිටියහ. අස්ගිරි-පෝයමළු දෙවෙහෙරට අයත් ගණනායකවරුන්ගේ ඇතැම් ශිෂ්‍යයෝ ද මේ සමාගමට එක්වූහ.[6]

## ස්‍යාමෝපසම්පදාව පිහිටුවීම

කල්යත්ම ලක්දිව උපසම්පදාව නැවතත් පිහිටුවීමේ අභිලාෂයෙන් කටයුතු කළ සරණංකර සාමණේරයෝ ඒ සඳහා රාජ්‍ය අනුග්‍රහය අත්‍යවශ්‍ය බැවින් නරේන්ද්‍රසිංහ රජුගේ සහය පැතූහ. එහෙත් ආගම දහම කෙරෙහි වැඩි නැඹුරුතාවක් නොපැවති රජුගෙන් බලාපොරොත්තු වූ ආකාරයේ අනුග්‍රයක් නොලැබිණි. මොහුගෙන් පසු රජ පැමිණි ශ්‍රී විජය රාජසිංහ රජු සරණංකර හිමියන්ගෙන් ශබ්ද ශාස්ත්‍රය හැදෑරූ නිසා යහපත් ප්‍රතිචාරයක් ඔහුගෙන් ලැබුණි. ඒ අනුව සරණංකර සාමණේරයන්ගේ ඉල්ලීම පරිදි ශ්‍රී විජය රාජසිංහ රජු රටවල් කිහිපයකට ම දූතයන් යැවූ බව මන්දාරම් පුර පුවතෙහි සඳහන් වේ.[7] නියෝජිතයන් යැවූ රටවල් ලෙස එහි දැක්වෙනුයේ දඹදිව මධ්‍ය මණ්ඩලය, රක්ඛංග දේශය (බටහිර බුරුමය) රාමඤ්ඤ දේශය (දකුණු බුරුමය) මුම්ම දේශය (උතුරු බුරුමය) කොරියාව සහ මොංගෝලියාවයි. මෙසේ ශ්‍රී විජය රාජසිංහ රජුගේ කාලයේ දූතයන් දෙවරක් ම යැවූ නමුත් ඒ එකදු අවස්ථාවක දී වත් උපසම්පදාව මෙරටට ගෙන ඒමට අපොහොසත් විය. ඉන්පසු ලක්දිව රාජ්‍ය පදප්‍රාප්ත වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ (ක්‍රි. 1747-1782) කාලයේ නැවත වරක් උත්සහවත් වී උපසම්පදාව රැගෙන එන්නට කටයුතු කළේය. සරණංකර හිමියන්ගේ උදාර ශාසනික පරමාර්ථයන් මස්තකප්‍රාප්ත කර ගන්නට හැකි වූයේ මේ රජුගේ කාලයේය. රජුගේ පදවිප්‍රාප්තියෙන් තෙවැනි වර්ෂයේ දී විල්බාවේගෙදර රාළ ඇතුළු පිරිසක් ඕලන්ද නැවකින් සියම බලා පිටත් විය. ඔවුන් සියම් භික්ෂූන් ද රැගෙන ආපසු ලංකාවට පැමිණියේ ක්‍රි. ව. 1753 දී බව ලන්දේශී වාර්තාවල පවා සඳහන් වේ[8]

මේ පිළිබඳ ව දීර්ඝ විස්තරයක් ස්‍යාමෝපසම්පදාවෙහි සඳහන් වේ. උපාලි ස්ථවිරයන් වහන්සේ හා ආර්යමනති තෙරුන් ශකවර්ෂ එක්වාදහස්සසිය පන්සැත්තෑ වන්නෙහි බ්‍රහ්මවිංශති සත්වැනි වූ ශ්‍රීමුඛාභිධාන සංවත්සරයෙහි වෙසක් මස පුර තුදුස්වක් ලත් රිවිදින ත්‍රිකුණාමලයට පැමිණි කල්හි ශ්‍රීවර්ධනපුරාධීශ්වර වූ කීර්ති ශ්‍රී මහ රජාණෝ එපවත් අසා රාජ මහාමාත්‍යාදීන් සහිතව මහ පෙරහරක් පෙරමගට යවා වඩම්මවාගෙන පැමිණියහ. ඉන්පසු කටකරවි දෙහාග වු තුඳුස්වක නම් තිථිය ලත් කිවිදින, හෙවත් ව්‍යාහාර වර්ෂ එක්දහස් හත්සිය පණස් තුන් වැන්නෙහි උපාලි මහාස්ථවිරයන්ගේ ශිෂ්‍ය නමක් පුෂ්පාරාමය විසුංගාම සීමාවේ දී උපාලි මහ ස්ථවිරයන් ප්‍රධාන මහාසංඝයා වහන්සේ විසින් උපසම්පදා කළහ. අනතුරුව ඊට පසු දින එනම් රා.ව. 1753 ක් වූ ජූලි මස 20 දින සය නමක් උපසම්පදාව ලැබූහ. ස්‍යාමෝපසම්පදාවේ වැඩිදුරටත් සඳහන් පරිදි

උපෝසථාරාමයේ නායක පදප්‍රාප්ත කොබ්බෑකඩුවේ උන්නාන්සේ, වැලිවිට සරණඞ්කර උන්නාන්සේ, හුලංගමුවේ උන්නාන්සේ, බඹරදෙණියේ උන්නාන්සේ, තිබබටුවාවේ උන්නාන්සේ හා අස්ගිරි විහාරේ නායක පදප්‍රාප්ත නාවින්නේ උන්නාන්සේ යන සය නම පිළිවෙළින් උපසම්පදා ලැබූ බව දක්වා ඇත.[9]

එහෙත් මන්දාරම්පුර පුවත පවසන්නේ නාවින්නේ සාමණේර හිමියන් දෙවෙනියටත් වැලිවිට සරණංකර හිමියන් තෙවෙනියටත් උපසම්පදා කළ බවය.[10] කොටගම වාචිස්සර හිමියන්ගේ අදහස වන්නේ ද එයයි.[11] එහෙත් සයාමෝපසම්පදාවේ එන තොරතුර වඩාත් පැරණි තොරතුරයි. මන්දයත් මෙම ග්‍රන්ථය රචනා කර ඇත්තේ තිබ්බටුවාවේ ශ්‍රී බුද්ධරක්ඛිත මහා සාමීන් විසිනි.[12] මන්දාරම්පුර පුවත ඒකකතෘක කෘතියක් නොවේ. 6 වෙනි පරිච්ඡේදය දක්වා කොටසෙහි කතුවරුන් පිළිබඳ සඳහන් වුවත් ඉන් පසු කොට රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද යන්න සඳහන් කර නොමැත.[13] සයාමෝපසම්පදාව පිළිබඳ විස්තරය ඇත්තේ සවැනි පරිච්ඡේදයෙන් පසුවය. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු දක්වා ම මන්දාරම් පුර පුවත විස්තර වන හෙයින් මෙය රචනා කරන්නට ඇත්තේ ශ්‍රී වික්‍රමසිංහ රජුගේ කාලයේ හෝ ඉන් පසුව බව සඳහන් කළ හැකිය. ඒ අනුව සමකාලීන ග්‍රන්ථයක් වන සයාමෝපසම්පදාවෙහි එන තොරතුර වඩාත් විශ්වසනීයත්වයෙන් යුක්ත බව සඳහන් කළ හැකිය. සරණඞ්කර සාමණේරයන් වන්සේගේ මෙම ධර්ම ශාස්ත්‍රීය සේවාව සඳහා උන්වහන්සේගේ ඇසුරේ සිටිමින් සහයෝගය දුන් <u>සිටිනාමළුවේ</u> යන සිල්වතුන් වහන්සේට මුල් අවස්ථාවේ දී උපසම්පදා විනයකර්මය ලබා ගැනීමෙහිලා අවස්ථාව උදා නොවූ බව පෙනේ. ඒ සඳහා බලපෑ කරුණු ලෙස විවිධ හේතූන් විවිධ අය විසින් දක්වන නමුදු ඒ කිසිවක් බුදුදහමට එකඟ වූ කරුණු නොවන බව මෙහිලා සඳහන් කළ යුතුය.

ඉහතින් දක්වන ලද ශාසනික අවස්ථාව පිළිබඳ ව ලියැ වී ඇති පැරණි වාර්තා සහ පර්යේෂණ කෘති රාශියකි. මෙම සෑම කෘතියකින් ම කියැවෙන්නේ රා.ව. 1753 ජූලි මස 19 දින හා එම ජූලි මස 20 දින සිට උපසම්පදා විනය කර්මය මල්වතු මහාවිහාරීය විසුංගාම සීමාවේ දී සිදුකළ බවය. මල්වතු විහාර භූමිය ඉදිකරන ලද භූමියෙහි තිබූ ධම්මිකාරාමය පළමුවැනි විමලධර්මසූර්ය සමයේ දී සිදුකළ උපසම්පදා විනය කර්මය සඳහා වැඩම කළ රක්ඛංග භික්ෂූන්ගේ ආවාස පහසුව සඳහා යොදාගැණිනි.[14] වික්‍රමබාහු රජු විසින් පිළිසකර කරන ලද චිත්‍රකූට මණ්ඩපය නම් වූ ධර්ම දේශනා පවත්වන ලද ස්ථානය ද ධම්මිකාරාමය බව සනාථ වෙයි. පිළිසකර කළ යුත්තේ එතෙක් පැවති ආ ගෘහ වස්තුවකි. චිත්‍රකූට මණ්ඩපය පිළිසකර කිරීමත් උපෝසථාරාමය ඉදි කිරීමත්, ආදාහන මළුව ගෙඩිගේ විහාරයත් ඉදිකළ වික්‍රමබාහු සේනාසම්මත වික්‍රමබාහු බවටද මතයක් ඇත. (As in the tradition, the Gedige vihara at Adahanamaluwa was built at place where the mother of a king named Vikramabahu was cremated. The king has been identified with Senasammata Vikramabahu who flourished in the second half of the fifteenth century; The site where this monument is found was the royal cremation grounds of the Kandyan kings. The Gedige vihara is essentiallay a Buddhist temple. The plane of building is the same as that of Natha Devala, Kandy.)[15]

සයාමෝපසම්පදාව සඳහා විදේශයෙන් වැඩිය මහාසංඝයා වහන්සේටත් දේශීය සාමණේරවරුන්ටත් ආවාස පහසුව සලසා තිබුණේ පුෂ්පාරාමයේය. අභිනව උපසම්පදා විනය

කර්මය සඳහා සම්බන්ධවන භික්ෂූන් වහන්සේලාට ධම්මිකාරාමයෙහි ඉඩකඩ ප්‍රමාණවත් නොවුණි. මේ අවස්ථාව වන විට ඇහැලේපොළ මුදියන්සේ විසින් හල්ලොලුව සහ පල්ලේ මාපනාවතුර අතර සපුගස්තැන්නේ කීර්ති ශ්‍රී රාජසිංහ වෙනුවෙන් නගරයක් ඉදිකර තිබුණි. එහෙත් එය කඩා එහි තිබූ ගොඩනැගිලි ද්‍රව්‍ය ගෙන පුෂ්පාරාමයෙහි නව ඉදිකිරීම් කරවා ඇත. එපමණක් නොව දළදා වහන්සේ වැඩ සිටි කුටියේ දොරවල් සඳහා යොදාගෙන ඇත්තේ එම ද්‍රව්‍යයයි. (some years after king Kirti Sri caused it be pulled down removed the materials to Kandy and built  the Malwate monastery {for the Siamese monks who brought the Upasampada ordination }  with the exeption of the two doors and frames of the royal bedchamber which were used in building the Dalada relic room of the Maligawa )[16]

වර්තමානයේ මල්වතු මහාවිහාරයෙහි දක්නට ලැබෙන ආවාස ගෙවල් සකසන්නට ඇත්තේ එක් එක් භික්ෂූන් වහන්සේට වැඩ සිටීම සඳහා වන්නට ඇතැයි සිතිය හැකිය. මේ සියල්ලක් ම මුල් කාලයේ සකසා ඇත්තේ මැටි මිශ්‍ර ගඩොල්වලිනි. කුඩා කාමර වන සේ සැකසූ පන්සල් බොහෝමයක් තිබුණත් වැලිවිට පන්සල, තිබ්බටුවාවේ පන්සල සහ මැද පන්සල වඩාත් ඉඩකඩ ඇතිව ඉදිකර ඇති අතර පැරැණි සම්ප්‍රදාය එම පන්සල් තුළින් විද්‍යමාන වීම වැදගත් වෙයි.

ගා. ව. 1753 වනවිට උපෝසථාරාමය හා ආදහන මළුවේ ගෙඩිගේ විහාරය ද ගොඩනැගී තිබුණි. එහෙත් උපාලි ස්ථවිරයන් ප්‍රමුඛ සංඝයා වහන්සේ විසින් ගෙනෙන ලද ස්‍යාමෝපසම්පදාව සඳහා උභය විහාරයෙහි මෙම ප්‍රධාන විහාරස්ථාන දෙක යොදා නොගැණිනි. ඊට හේතුව ආදාහන මළුව ගෙඩිගේ විහාරයෙහි උපොසථාගාරයක්  මේ කාලය වනවිට තිබුණු බවට මූලාශ්‍ර ග්‍රන්ථයන්හි සඳහන් නොවීම නිසා විය හැකිය.  මේ වනවිට පෝයමළු විහාරයෙහි උපොසථාගාරයක් තිබුණි. වික්‍රමබාහු රජු විසින් කරන්නට යෙදුණු ධම්මිකාරාමය නමින් හැඳින් වූ ස්ථානය අභිනව උපසම්පදා විනය කර්මය සඳහා යෙදා ගන්නට ඇත්තේ මෙකල මෙය ගණින්නාන්සේලාගේ වාසභවනයක් ලෙස නොතිබුණු නිසාය. එසේ ම සරණංකර සාමණේරයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් ගොඩනැගූ සිල්වත් සමාගමේ අනන්‍යතාව ද එයින් ආරක්ෂා වන නිසාත් එම ස්ථානය තෝරාගන්නට ඇතැයි සිතිය හැකිය. ස්‍යාමෝපසම්පදාවෙහි පැහැදිලිව දක්නට ලැබෙන තොරතුරක් වන්නේ සියම් රටින් පැමිණි උපාලි ස්ථවිරයන් ප්‍රමුඛ සංඝයා වහන්සේට මල්වතු විහාරයෙහි අභිනවයෙන් ඉදිකරන ලද විහාරයක නවාතැන් පහසුකම් ලබා දුන් බවය.  උපසම්පදා විනය කර්මය ද මේ ස්ථානයෙහි ම කරන්නට පහසුව නිසා උන්වහන්සේලා මේ ස්ථානයෙහි රඳවා ඇත. ඒ අනුව අභිනව ශාසන සම්ප්‍රදාය වූ ස්‍යාමෝපාලි මහා නිකායික මල්වතු මහාවිහාරීය භික්ෂු පරපුර ආරම්භ වී ඇත්තේ මේ ආකාරයෙනි.

ස්‍යාමෝපසම්පදාව ලක්දිවට රැගෙන ඒමෙන් පසු අවුරුදු දොළහක් තිස්සේ උපසම්පදා විනය කර්මය සිදු කර ඇත්තේ මල්වතු මහා විහාරයේය.[17] එනම් ක්‍රි. ව. 1765 වර්ෂය දක්වා ය. ඉන්පසු අභිනවකීර්ති ශ්‍රී රාජසිංහ රජු අභිනව උපසම්පදාවක් කළ බව එහි සඳහන් වන අතර මෙම උපසම්පදා විනය කර්මය කරන්නට ඇත්තේ අස්ගිරි විහාරයේ ආදාහන මළුව ගෙඩිගේ විහාරයේ විය හැකිය. පසුකාලීනව මල්වතු අස්ගිරි වශයෙන් පාර්ශ්ව දෙකක් වශයෙන් උපසම්පදා විනය කර්මය සිදු වුවත් ප්‍රථම උපසම්පදාවට අයත් අස්ගිරි විහාරයේ නායක පදවි ප්‍රාප්ත නාවින්නේ තෙරුන් ද උපසම්පදාව ලබා ඇත්තේ මල්වතු විහාරයේ උපෝසථාගාරය තුළ දී ම ය. ඒ අනුව මල්වතු විහාරයේ

උපොසථාගාරයේ දී උපසපන් වූ සියළු දෙනා වහන්සේ මල්වතු මහාවිහාරයීය භික්ෂු පරපුරට අයත් වෙති. ස්‍යාමොපසම්පදාව තුළින් මෙරට බිහි වූ ස්‍යාමෝපාලි මහානිකාය නම් වූ අභිනව ශාසන වංශයේ ආරම්භය ඇති වන්නේ මල්වතු මහාවිහාරයීය භික්ෂු පරපුර තුළිනි.

## සංඝරාජ පදවිය

වැලිවිට සරණංකර මාහිමියන් ශාසනයෙහි ආයත්‍යාභිවෘද්ධිය උදෙසා කරන ලද යුග මෙහෙවර වෙනුවෙන් කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් උන්වහන්සේ සියලු දෙනාගේ සංඝරාජ වශයෙන් පත්කොට ඇත.[18] මන්දාරම්පුර පුවත එම විස්තරය ගෙන එන්නේ මෙසේය.[19]

තබමින් සුරත පැවසූ මෙලෙස අදරින

හිමිඳුන ඔබ සතුය තුන් ලක බුදුසසුන

සමගින දෙවෙහෙර ද ලක්දිව සියලු තැන

කුළුණින සඟරාජ තනතුර කරනු මැන

මෙම කවිය තුළින් පෙනී යන්නේ සියම් නිකායික අභිනව ශාසන වංශය ලෙස ඇති වූ මුල් යුගයේ සිටි සරණංකර සංඝරාජෝත්තමයාණන් උභය විහාරයීය වශයෙන් හෝ මල්වතු අස්ගිරි වශයෙන් දෙපාර්ශ්වයකට හෝ නිකායික වශයෙන් හෝ ගණයකට වශයෙන් හෝ අයත් නොවූ උතුමෙකි. වර්තමාන කවර නිකායක් හෝ කවර උගතෙක් හෝ සංඝරාජයන් ප්‍රභවය කොට ඇති වූ හෙයින් ශාසනාභිවෘද්ධියෙහි හා ශාස්ත්‍රාභිවෘද්ධියෙහි මුල් ගුරුවරයා උන්වහන්සේ ම බව අවිවාදයෙන් පිළිගත යුතුය. මිහිඳු මාහිමියන්ගෙන් ඉටු වූ සේවාව හා සමාන මෙහෙවරක් මුන්වහන්සේගෙන් සිදු වීම ඊට හේතුවයි. ඒ අනුව ලක්දිව සිටි සියලු භික්ෂූන්ගේ ප්‍රධානියා වූයේ මුන්වහන්සේය. මෙසේ සියලු දෙනාගේ නායකත්වය තමන් වෙත පැවරුණත් කිසි දිනක එයින් උදම් නොවූ මුන්වහන්සේ තම පන්සලේ උළුවස්සේ ''උඩඟු නොව මහණ'' යන පාඨය ලියා තැබීමට තරම් නිහතමානී වූහ. පදවි, තානාන්තර ලැබීම ඇතමුන්ගේ අහංකාරයට හේතුවක් වන බව අවබෝධ කරගත් මුන්වහන්සේ එවැනි පාඨයක් ලියා තබා තමා කිසි විටෙකත් ලැබූ දෙයින් උඩඟු නොවන බව දැන්වීමට කටයුතු කර ඇත. ඉන්පසු උන්වහන්සේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු සමග එක්ව ''කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත'' ඇතිකර ශාසනික කටයුතු තහවුරු කිරීමෙන් පෙනී යන්නේ මුන් වහන්සේ ශාසනයෙහි ආයත්‍යාභිවෘද්ධිය අපේක්ෂා කළ උතුමෙක් බවය.

## මහානායක පදවි

ස්‍යාමෝපසම්පදාවෙන් පසු සංඝරාජ පදවියට අමතරව භික්ෂු පරිපාලනයට පහසුව සඳහා **මහානායක** නමින් ධුර දෙකක් ද පත්කර ඇත. ස්‍යාමෝපසම්පදාවට පූර්ව සමයෙහි උභය විහාරවාසී සාමණේරවරුන් අතර මෙවැනි ධුර දෙකක් දක්නට නොමැත. ඒ සඳහා දැක්වීමට තරම් සාදක ද නොමැත. කොටගම වාචිස්සර හිමියන් පෙන්වා දෙන්නේ ස්‍යාමෝපසම්පදාවට පෙර විහාර දෙකේ

කිසිදු අසමගියක් නොතිබුණු අතර, පසුව යම් යම් අසමගිකම් ඇති වූ බවය. එහෙත් ඒවා තාවකාලිකව ඇති වූ ඒවා වන අතර දීර්ඝකාලීන ඒවා නොවීය. ඇතැම්විට භික්ෂූන් අතර මෙවැනි දෙයක් ඇතිවන්නට ඇත්තේ සංඝරාජ මාහිමියන් වැඩි වශයෙන් මල්වතු මහාවිහාරයෙහි වැඩසිටි නිසා විය හැකිය. එමනිසා මල්වතු මහාවිහාරයට වැඩි වරප්‍රසාදයක් හිමිවන්නට ඇත. තමන් ලබන වරප්‍රසාද තව කෙනෙක් ලැබීම නොරිස්සූ සමහර භික්ෂූන්ගේ නොමනා ප්‍රකාශන මෙම විරෝධතාවන්ට හේතු වන්නට ඇත.

ස්‍යාමෝපසම්පදාවෙන් පසු කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් සිරිලක පුරා ව්‍යාප්තව තිබුණු විහාරස්ථාන 4800 ක් උභය විහාර දෙකට බෙදා මහානායක පදවි තනතුරු ද දී විහර දෙක වෙන වෙන ම පැවරූ බව සඳහන් වේ. එහිදී විහාර දෙකට දෙදහස් හාරසීය බැගින් සම සමව විහාර බෙදූ බව සඳහන් වේ.[20]

දෙදහස් සිව් සියක් තුන් ලක මහ වෙහෙර
සමගින පවර උපසඟරාජ තනතුර
මහානායක දුරය ද මල්වතු වෙහෙර
පිළිගෙන රකිනු මැන බුදුසසුන ලක්පුර

දෙදහස් සිව් සියක් මහ වෙහෙර සමගින
අස්ගිරි වෙහෙර මහනායක කම සොබන
උපසඟරජ තනතුර ගරු පිළිරැගෙන
තුන් ලක බුදුසසුන නියතින් රකිනු මැන

මේ කවි දෙකට අනුව මල්වතු විහාරයෙහි හා අස්ගිරි විහාරයෙහි නායකත්වයට වෙන වෙන ම මහානායක හිමිවරු දෙදෙනෙක් පත් කොට ඇත. ඒ අනුව මල්වතු විහාරයෙහි මහානායක තනතුර තිබ්බටුවාවේ බුද්ධරක්ඛිත හිමියන්ට හා අස්ගිරි විහාරයෙහි මහනායකත්වය උරුලෑවත්තේ ධම්මසිද්ධි හිමියන්ට පවරා ඇත. එහෙත් කොටගම වාචිස්සර හිමියන් පවසන්නේ සරණංකර සංඝරජයන් වහන්සේගේ අසීමිත බලතල යොදා ගනිමින් විහාර දෙකට මහානාහිමිවරු දෙනමක් පත් කිරීම නොකළ යුතුව තිබුණා නම් හොඳ බවය.[21] එකම මහානායක තනතුරක් යටතේ පාලනය වීමට ඉඩ හැරියේ නම් ඇතැම්විට අර්බුද වැඩිවීමට ද පුළුවන. විශේෂයෙන් උපසම්පදා විනය කර්මය පිළිබඳ වගකීම විහාර දෙකට පවරන ලද්දේ එහි සුරක්ෂිත බව නිසා විය හැක. වසර 250 කට වැඩි කාලයක් ශාසනික වගකීම් කරගෙන ඒමේ හැකියාව විහාර දෙකට ලැබෙන්නට ඇත්තේ ද එහි වගකීම දෙදෙනෙකුට පැවරීම නිසාය.

මුල් කාලයේ මහානායක පදවිය පිරිනමා ඇත්තේ රජු විසිනි. ඒ අනුව තිබ්බටුවාවේ බුද්ධරක්ඛිත මහනාහිමියන්ගෙන් පසුව මල්වතු විහාරයේ මහානායක පදවිය පිළිවෙලින් මැදවල ශ්‍රී ආනන්ද, දරමිටිපොල ශ්‍රී ධර්මරක්ෂිත, යන ස්ථවිරයන් වහන්සේලා කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් පදවි

ලැබූ අතර, රාජාධිරාජසිංහ රජුගේ කාලයේ මොරතොට ධම්මක්ඛන්ධ ස්වාමීන්ද්‍රයන්ට එකී මහානායක පදවිය පිරිනමා ඇත. මෙසේ ඉංග්‍රීසීන්ට මේ රට යටත් වනතුරු මහ පදවිය පිරිනමා ඇත්තේ රජු විසිනි. 1815 න් පසුව ද බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ මැදිහත් වීම තුළින් ශාසනික පදවි පිරිනැමුණු අතර 1847 කරන ලද ඉල්ලීමකට අනුව බ්‍රිතාන්‍ය ආණ්ඩුව සිය මැදිහත් බවින් ඉවත් ව ඇත. 1847-04-23 දින ආණ්ඩුකාරවරයා විසින් දෙවෙහෙර සංඝයා එක්රැස් කරවා දළදා වහන්සේ පිළිබඳ ආරක්ෂාවත් බෞද්ධ කටයුතු පිළිබඳ වගකීමත් දෙවෙහෙර මහා සංඝයා වහන්සේට හා රදලවරුන්ට පවරා ඇත.[22] ඒ අනුව ව්‍යවස්ථා 46 කින් යුත් ''ජිනශාසනෝපකාර'' නැමති සමාගම පිහිටුවා මහානායක පදවිය, අනුනායක පදවිය, ප්‍රාදේශීය නායක පදවි සහ දියවඩන නිලමේ තනතුර පත් කිරීමේ හා අවලංගු කිරීමේ බලය එම සමාගම විසින් දරා ඇත. මෙහිදී උභය විහාරයෙහි මහානායක පදවි හා අනුනායක පදවි පත් කිරීමේ දී නේවාසික වූ වස් දහයක් සම්පූර්ණ කර ඇති භික්ෂූන් වහන්සේගේ කැමැත්ත ලබා ගත යුතුය. වත්මන් වීසති වර්ගික කාරක සභාවක් එකළ නොවූ හෙයින් මහාවිහාරීය නේවාසික උපසම්පන්න භික්ෂූන් කාරක සභා ලෙස දක්වා ඇත. උභය විහාරීය නේවාසික උපසම්පදා කාරක මහා සංඝ සභාවේ ඡන්ද විමසීමෙන් 1853 මැයි 04 දින අස්ගිරි මහාවිහාරයේ මහානායක පදවිය පත්කර ඇත. අළුත්ගම, යටවත්තේ, පැපලේ, වත්තේගම යන ස්ථවිරයන් වහන්සේලා මහ පදවිය සඳහා ඉදිරිපත් වූහ. සුදුස්සෙකු තෝරා ගැනීම විනිශ්චය සභාවකට යටත් කොට විනිශ්චය සභාවේ තීරණය අනුව යටවත්තේ සුවණ්ණජෝති ස්වාමීන්ද්‍රයන් වහන්සේ මහ පදවිය සඳහා තෝරා පත්කරගෙන ඇත.[23] පැපලේ අත්ථදස්සි හිමියන් අනුනායක පදවියට හැ බදුළු මුතියංගන විහාර පදවියට තෝරාගත් අතර, හයගිරි මහාවිහාරීය 75 නමකගේ කැමැත්ත ඒ සඳහා ලැබී ඇත. ඉන්පසු මධ්‍යම පළාත් භාර ඒජන්ත උන්නාන්සේට එය රපෝර්තු කළ බව ද එහි සඳහන් වේ.

රා. ව. 1850 දි මල්වතු මහා විහාරයෙහි ද මහානායක පදවිය පුරප්පාඩු වී ඇත. මහානායක පදවියේ වැඩ බැලීම සඳහා පරකුඹුරේ විපස්සි මාහිමියාණන් වහන්සේ පත්කරගෙන තිබුණි. උන්වහන්සේගේ අපවත් වීමෙන් පසු මල්වතු මහාවිහාරීය නේවාසික උපසම්පදා කාරක මහා සංඝ සභාවේ 45 නමකගේ වැඩි කැමැත්තෙන් 1962 ජනවාරි 26 දින මැදගම ශ්‍රී දේවමිත්ත හිමියන් මහානායක පදවියට පත්කරගෙන ඇත.[24] මේ උභය මහාවිහාරයෙහි ප්‍රථම වතාවට නේවාසික උපසම්පදා භික්ෂූන්ගේ කැමැත්තෙන් මහ පදවි පත්කළ අවස්ථා ලෙස දැක්විය හැකිය. වර්තමානයේ උභය මහාවිහාරයෙහි ම මහපදවි ඇතුළු අනෙකුත් පදවි පත් කරනු ලබන්නේ විංශද් වර්ගික කාරක මහා සංඝසභාවේ ඡන්ද විමසීමෙනි. මල්වතු මහාවිහාරයෙහි එසේ විංශද් වර්ගික කාරක සංඝසභාවේ අනුමැතියෙන් මහපදවිය පත්කළ ප්‍රථව අවස්ථාව ලෙස දැක්වෙන්නේ 1893-09-26 දින තිබ්බටුවාවේ ශ්‍රී සුමංගල අනුනාහිමියන් මහපදවියට පත්කිරීමත් සමගය. වීසති වර්ගික වුවත් මෙහි දී කැමැත්ත ලැබී ඇත්තේ භික්ෂූන් වහන්සේලා 17 නමකගේ පමණි.[25] මෙම ක්‍රමවේදය වර්තමානය දක්වා ම පවත්වාගෙන එනු ලබයි.

## මහානායක පදවියේ බලතල

වර්තමානයේ මහානායක පදවිය සතු බලතල බොහෝය. මල්වතු මහාවිහාරයේ මහානායක පදවිය පිළිබඳ ප්‍රදානය කරනු ලබන ශ්‍රී සන්නස් පත්‍රයෙහි සඳහන් වන අන්දමට මහානායක මාහිමියන් ප්‍රධාන වශයෙන් උපෝෂිත පුෂ්පාරම විහාර දෙකේ විහාරාධිපතිත්වයට පතවන අතර,

එයින් නේවාසික මහාසංඝයාගේ ප්‍රධානත්වය ද මුන්වහන්සේ විසින් උසුලනු ලබයි. නේවාසික මහාසංඝයාට අවවාද අනුශාසනා දීම මුන්වහන්සේ සතු කාර්යයකි. ධර්ම විනයට නොගැලපෙන ආකාරයේ ක්‍රියාවන් හි යෙදෙන යම් භික්ෂුවක් සිටීනම් උන්වහන්සේට අවවාද අනුශාසනා කොට එයින් අත්මිදීමට කටයුතු සිදු කළ යුතුය. හිඳගල, දෙල්දෙණිය, බුජස්ලෙන, කුරුවාලෙන, පෙරියකඩුව ආදි විහාරයන්හි නිශ්චල චංචල දේපලවල සියලු වගකීම් මහානායක පදවියට අයත් වේ. මීට අමතරව මහානායක මාහිමියන්ගේ අනුදැනුමෙන් ලේවැල්ලේ ගංගාරාමය හා වල්ගම්පාය රජමහා විහාරස්ථානයන්හි වගකීම කාරක මහා සංඝ සභාවේ අනුමැතියෙන් කාරක මහා සංඝ සභාවට අයත් තෙරනමකට පවරන අතර එහි සියලු වගකීම් එම භික්ෂූන් වහන්සේ සතු වේ. මීට අමතරව දිසා අනුදිසා පළාත් කෝරළ පත්තු ආදි ප්‍රදේශයන්හි පත්කරනු ලබන ප්‍රධාන සංඝනායක, උපප්‍රධාන සංඝනායක, ද්විතීය සංඝනායක, අධිකරණ සංඝනායක ආදි සංඝනායක තෙරුන් වහන්සේලා මෙන් ම අටමස්ථානය, ශ්‍රී පාදස්ථානය, කැලණි විහාරය, තිස්සමහාරාම, වල්ගම්පාය, ආදි ප්‍රධාන විහාරස්ථාන මෙන් ම මල්වතු විහාර පාර්ශ්වයට අයත් සියලු ම සංඝයා වහන්සේලා මහානායක මාහිමියන්ට යටත් ව ගරු බුහුමන් දැක්විය යුතුය. ශ්‍රී දළදා මාළිගාවේ රන් කරඬුවෙහි රන් යතුර ගෙන ශ්‍රී දළදා වහන්සේ ආරක්ෂා කිරීමේ වගකීම ද මහානායක මාහිමියන් සතුය. මෙකී වගකීම පැවරෙන්නේ උභය මහාවිහාරයෙහි මහානායක මාහිමිවරුන් ට හා දියවඩන නිළමේතුමාටය. දළදා වහන්සේ ප්‍රදර්ශනය කරන දින වකවානු තීරණය කොට මෙකී තුන්දෙනාගේ මූලිකත්වයෙන් එය සිදු කරනු ලබයි. දළදා වහන්සේ වැඩසිටින රන්කරඬුව විවෘත කිරීම සඳහා මෙකී තුන් දෙනාගේ සහභාගීත්වය අනිවාර්ය වේ. මන්දයත් රන් කරඬුව මෙකී තිදෙනා අත ඇති යතුරු තුනෙන් විවෘත කළ යුතු නිසාය.[26] (රන් කරඬුව යතුරු තහඩු තුනකින් සමන්විතය) මීට අමතරව පුරප්පාඩු වූ කාරක පදවියක් (තුනේ වියදම් පඩිය) පත්කිරීම මහානායක මාහිමියන් සතු වූවකි. මීට අමතරව උපෝසථාගාරයෙහි ඇති ගරු ලඝු භාණ්ඩ සියල්ලෙහි අයිතිය මහානායක මාහිමියන් සතු වේ. අස්ගිරි මහාවිහාරයේ ද මෙම ක්‍රමවේදය එලෙසින් ම පවතී. අස්ගිරි මහාවිහාරයට අයත් මහානායක පදවියේ කලින් කලට දෙනු ලබන සන්නස් පත්‍රයේ බලතල වෙනස් වී ඇති බවක් දක්නට ලැබේ. 1999 දී අවසන් වරට මහානායක පදවියට පත් වූ උඩුගම ශ්‍රී බුද්ධරක්ඛිත මහානායක මාහිමියන්ට දී ඇති සන්නසෙහි සඳහන් අන්දමට අස්ගිරි ගෙඩිගේ විහාරය, සෙන්කඩගල අළුත් රජමහ විහාරය, අළු විහාරය, වටරක්ගොඩ, සගම, අම්බුළුගල, ලෙනගල, විල්බාව, ආදි විහාරස්ථාන මෙන් ම බදුළු මුතියංගන රාජමහා විහාර, රන්ගිරි දඹුලු විහාරය, යුදගනා චෛත්‍යස්ථානය, සොළොස්මස්ථාන, ඇත්කඳ විහාරය, ආදි විහාරස්ථානයන්හි ඇති අතර ඇතැම් විහාරස්ථානවලට නායක හිමිවරු පත්කොට ඇති සැටියක් පෙනේ. රන්ගිරි දඹුලු විහාරය වර්තමානයේ වෙන ම පාර්ශ්වයක් වශයෙන් බෙදී ඇත.[27]

## අනුනායක පදවිය

සංඝරාජ, මහනායක පදවි මෙන් ම කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් පිරිනමන ලදැයි විශ්වාස කරන පදවියක් වන්නේ අනුනායක පදවියයි. ශාසන ඉතිහාසයෙහි සඳහන් තොරතුරුවලට අනුව භික්ෂු පරපුරෙහි පදවි රාශියක් තිබී ඇත. ඒ අනුව සංඝරාජ, මහාසාමි. උපසංඝරාජ, මහානායක. මහාථෙර, අනුථෙර ආදී වශයෙන් එකී පදවි හඳුන්වා ඇත. මේ ක්‍රමවේදය ම අනුගමනය කරමින්

ස්‍යාමෝපසම්පදාව පිහිටුවීමෙන් පසු ද අනුනායක ධූරයක් පිරිනමන්නට ඇතැයි පිළිගත හැකිය. උභය මහාවිහාරයෙහි ම මෙවැනි අනුනායක පදවියක් පත්කරන්නට යෙදුනේ භික්ෂූන් අතර සමගිය ඇතිකරලීම උදෙසාය. සමාන සුදුසුකම් ඇති භික්ෂූන් දෙනමක් හෝ කිහිප නමක් සිටි විට ඔවුන් අතරින් එක් භික්ෂුවකට පමණක් පදවියක් පිරිනැමීම ගැටලු රාශියක් මතු කිරීමට හේතුවක් වෙයි. ඊට සෙසු භික්ෂූන්ගෙන් ද ලැබුනේ විරෝධාකල්පයකි. ප්‍රබල භික්ෂූන් එසේ විරුද්ධ වීම රටේ රජුට පවා බලපායි. මේ හේතුවෙන් අනුනායක පදවිය පිරිනැමීම ඒ කාලයේ පටන් ම සිදු වී තිබේ. මල්වතු මහාවිහාරයෙහි අනුනායක පදවිය පිරිනැමීම සම්බන්ධයෙන් ප්‍රධාන අදහස් තුනක් පවතී.[28]

1. සිංහලේ මහරජතුමා විසින් ම (අනෙකුත් ශාසනික පදවි මෙන්) පත්කළ බව
2. මහා සංඝ සභාවේ සම්මතයෙන් පත් කරන ලද බව
3. මහා සංඝ සභාවෙන් සම්මතය අනුව පත් කරන ලදුව මහ රජතුමා විසින් අනුමත කරන ලද බව

සඟරජවතෙහි සඳහන් අන්දමට ප්‍රථම අනුනායක පදවිය පිරිනමා ඇත්තේ සංරණංකර මාහිමියන්ගේ සිව්වැනි ශිෂ්‍යයා වූ රඹුක්වැල්ලේ ශ්‍රී ධර්මරක්ෂිත හිමියන්ටය.

වැඩකර හසුන් වැඩි සඟරජුගේ මෙලෙක
පැනසර ගෝලයො ඇත දැනගත් නොයෙක
ගුණතර රඹුක්වැල්ලේ දෙවන නායක
තනතුර තිබෙන යති දුන් එක ගෝලයෙක[29]

මේ කාලයේ දී ම මොරතොට ධම්මක්ඛන්ධ හිමියන්ට ද අනුනායක පදවියක් තිබූ බව ස1ගරජවතෙහි සඳහන්වේ.

දෙලොවට ලොවට පිහිටට කුළුණු සිඳු වැද
දහමට ලැබ නොසිතා උගත් පිරිසඳ
මොරතොට දෙවෙනි නායක තෙරිඳු දම් කඳ
ගණදෙට සඟ රජුන් ගේ ගොලයෙකි සොඳ[30]

සංඝරාජ මාහිමියන්ගේ ම ගෝලයෙකු වූ මොරතොට ධම්මක්ඛන්ධ හිමියන්ට අනුනායක පදවියක් පිරිනමා ඇත්තේ රාජාධිරාජසිංහ රජු විසින් බව මුඛ පරම්පරාගත ව පැවතෙන්නකි. මොරතොට හිමියන් හා රාජාධිරාජසිංහ රජු අතර පැවති ගුරු ශිෂ්‍ය සම්බන්ධතාවය මේ කෙරෙහි ප්‍රධාන හේතුවක් වන්නට ඇතැයි සිතිය හැකිය. රජුගේ පැමිණීම ප්‍රමාද වීමෙන් නේවාසික කාරක මහාසංඝ සභාවේ තීරණයෙන් එක් තෙර නමකට අනුනායක පිදූ අතර රජුට උවමනා වුයේ මොරතොට ධම්මක්ඛන්ධ හිමියන්ට අනුනායක පදවිය පිරිනැමීමටය. ඒ අනුව රජු විසින් පත් කරන ලද අනුනායක පදවිය හා කාරක සංඝ සභාව විසින් පත් කරන ලද අනුනායක පදවිය වශයෙන් අනුනායක පදවි දෙකක් මල්වතු විහාරය සතුය. එකී පදවිය රජු විසින් පිරිනැමුවත් වර්තමානයේ මේ පදවි දෙක ම පත් කරනු ලබන්නේ කාරක මහා සංඝ සභාවේ ඡන්ද විමසීමෙනි. මෙම පදවි දෙක ම

සඳහා සංඝ සම්මතය, රාජකීය අනුග්‍රහය හා පිළිගැනීම සම්පූර්ණයෙන් ම ලැබී ඇති බව තේරුම් ගැනීම ඉතා වැදගත් වේ.

අස්ගිරි විහාරයෙහි එවකට අනුනායක පදවි තුනක් තිබූ බවට තුඹුල්ලේ ශ්‍රී සීල්ක්ඛන්ධ හිමියන් විසින් රචිත ''අස්ගිරි මහාවිහාරයේ ප්‍රභවය, විකාශය හා තදනුබද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය'' නම් කෘතිය තුළින් පෙන්වා දෙයි. එහිදී ග්‍රන්ථ හා විදර්ශනා ධුර වශයෙන් වෙන වෙන ම අනුනායක පදවි පත්කොට ඇත. ඒ අනුව ආරම්භයේ දී ග්‍රන්ථ ධුරයට ඉඳවලුගොඩ ධම්මපාල, දැඹව ධම්මපාල යන දෙන ම පත්කළ අතර, විදර්ශනා ධුරයෙහි අනුනායක වශයෙන් රඹුක්වැල්ලේ රතනජෝති හිමියන් පත් කොට ඇත.[31] මෙකී පදවි තුනෙන් වර්තමානයේ ඇත්තේ පදවි එකක් පමණි. ඊට හේතු වශයෙන් දක්වන්නේ විදර්ශනා ධුරය අස්ගිරි විහාරයෙන් අහෝසි වීම නිසා එකී අනුනායක පදවිය පත් නොකළ අතර, අනෙක් පදවිය වාරියපොල ශ්‍රී සුමංගල හිමියන්ගෙන් පසුව උන්වහන්සේට ගරු කිරීමක් වශයෙන් පත් නොකළ බවය.[32] (එහෙත් මේ පිළිබඳ ව ලේඛනගත තොරතුරක් සොයාගත නොහැකි විය.)

**අනුනායක පදවියේ වගකීම**

අනුනායක පදවියේ වැදගත් ම කාර්යභාරය ඉටුවන්නේ මල්වතු මහාවිහාරයේ උපසම්පදා විනය කර්මය සිදුවන කාලවකවානුවේ දී ය. උපසම්පදාපේක්ෂක සමාණේරවරුන්ගෙන් 'පාඩම් ඇසීම' සිදුවන්නේ අනුනායක ස්වාමීන්ද්‍රයන් වෙතිනි. මහානායක මාහිමියාණන් නැති අවස්ථාවක දී උපසම්පදා විනය කර්මයේ ප්‍රධානත්වය උසුලනු ලබන්නේ අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේය. මල්වතු මහා විහාරයට නන් දෙසින් පැමිණෙන උපසම්පදාපේක්ෂකයන් සියලු දෙනාට ම උපාධ්‍යායන් වහන්සේ වශයෙන් කටයුතු කිරීමට මහානායක මාහිමියන්ට නොහැකි නිසා එහි වැඩි කාර්යභාරයක් ඉෂ්ට කිරීමට සිදුවන්නේ අනුනායක මාහිමියන්ටය. මහාවිහාරයෙන් පත්කරනු ලබන ප්‍රාදේශීය නායක පදවිවල දී පවත්වන පිළිගැනීමේ උත්සව සඳහා මෙන් ම අදාළ පාර්ශ්වයට අයත් පිළිගත් භික්ෂූන්ගේ ආදාහන උත්සව, සාකච්ඡා, රැස්වීම් වැනි රටේ නොයෙක් ජාතික, ආගමික, සාමාජික වශයෙන් පැවැත්වෙන උත්සව අවස්ථාවල දී අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වෙත විශාල වගකීමක් පැවරේ. මෙහි දී මහානායක මාහිමියාණන් නියෝජනය කරනු ලබන්නේ අනුනායක ස්වාමීන්ද්‍රයන් විසිනි. එසේ ම පොහොය දිනයන් හි පැවැත්වෙන පාමොක් දෙසීම ද අනුනායක ස්වාමීන්ද්‍රන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් මහාවිහාරීය භික්ෂූන් වහන්සේලාගෙන් කෙනෙකු විසින් සිදු කරනු ලබයි. මහාවිහාරය වෙත පැවරෙන පිරිත් දේශනා, දානමය පුණ්‍ය කටයුතු ආදියෙහි දී ද අනුනායක ස්වාමීන්ද්‍රයන්ගේ වගකීම විශාලය. දිවයිනේ විවිධ ප්‍රදේශවල විහාරස්ථානයන්හි සිදු කරනු ලබන 'සීමා සම්මත' කිරීම වැනි විනය කටයුතුවලදී අනුනායක ස්වාමීන්ද්‍රයන්ගේ සහභාගීත්වය ඉතා වැදගත් තැනක් ගනු ලබයි.

අනුනායක ස්වාමීන්ද්‍රයන්ගේ භූමිකාව වඩාත් වැදගත් වන අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැක්කේ මහානායක මාහිමියාණන් කෙනෙකුගේ අවමඟුල් අවස්ථාවක් පැමිණි විට දීය. පුරප්පාඩු වූ මහ පදවිය පත් කරනතුරු ශ්‍රී දළදා මාළිගාවේ රන් කරඬුවේ රන් යතුර සුරක්ෂිත කිරීම ප්‍රධානතම කාර්යයක් වන අතර ආදාහන කටයුතු අවසන් වනතුරු උන්වහන්සේගේ අවවාද අනුශාසනා මධ්‍යයේ එය සිදු කළ යුතුය. මෙහිදී ශිෂ්‍ය බාලාදීන්ගේ මෙන් ම දායක කාරකාදීන්ගේ සහයෝගයෙන්

දියවඩන නිළමේට දැනුම් දීම හා අනෙකුත් රාජ්‍ය තාන්ත්‍රිකයන්හට මෙන් ම ප්‍රභූන්ට හා සියලු දෙනාට ම දැන්වීම මුන්වහන්සේගේ මූලිකත්වයෙන් සිදු වේ.

ඉන්පසු පුරප්පාඩු වූ මහ පදවිය පත් කිරීම සඳහා දින නියම කිරීම, කාරක සංඝ සභාවේ දී මූලිකත්වය ගෙන කටයුතු කිරීම අනුනායක ස්වාමීන්ද්‍රයන්ට පැවරේ. එසේ ම මහපදවිය අනුනායක පදවිය ආදිය පත් කිරීමෙන් පසු අස්ගිරි විහාරයට එය දැනුම් දීම චාරිත්‍රයක් වන අතර එහි දී ද අනුනායක ස්වාමීන්ද්‍රයන්ගේ මූලිකත්වය හා සහභාගීත්වය අත්‍යවශ්‍ය වේ. මෙකී සෑම දෙයක් ම උභය මහාවිහාරයේ ම අනුනායක හිමිවරුන්ට පැවරෙන කාර්යයකි.

## ප්‍රාදේශීය නායක පදවි

ප්‍රාදේශීය වශයෙන් නායක පදවි පිරිනැමීම ස්‍යාමෝපසම්පදාවෙන් පසු සිදු වූ තවත් සිද්ධියක් ලෙස දැක්විය හැකිය. උභය මහාවිහාරයට අයත් විහාරස්ථාන පිළිබඳ ව නිතර නිතර සොයා බැලීම් සිදු කිරීමට උභය මහාවිහාරීය භික්ෂූන් වහන්සේලාට අවස්ථාවක් නොමැති නිසා එකී විහාරස්ථානයන්හි සිදුවන ශාසනික කටයුතුවල මූලිකත්වය ගෙන කටයුතු කිරීම වැනි දේ පදනම් කරගෙන ප්‍රදේශීය නායක කෙනෙකු පත් කරන්නට ඇතැයි සිතිය හැකිය. මල්වතු මහා විහාරයෙහි අඹන්වැල්ලේ ඇති පැරණි ලියවිලිවලට අනුව මුල් යුගයේ මෙකී පදවිය හඳුන්වා ඇත්තේ 'අනුනායක' යන නමිනි. වර්ෂ එක්දහස් අටසිය විසිපහක් වූ අගෝස්තු මස අටවැනි දිනැති ව එඩ්වඩ් බාන්ස් විසින් බෝගහවිල ධම්මපාල හිමියන්ට දෙන ලද සන්නස් පත්‍රයෙහි මෙසේ සඳහන් වේ. ''මෙම බෝගහවෙල්ලස්සේ අනුනායකකම පවත්වනතුරු සිංහලේ පවතින චාරිත්‍රවල හැටියට .........මෙයින් බරපතල ලෙස අනාඥා කරන්ඩ යෙදුනාය.[33]

එසේ ම ''මධ්‍යම දිසාවේ මහනුවර ආණ්ඩුවේ ඒජන්ත උන්නාෂේට දේවාසිර්වාද ස්තුති පැවැත්වීමෙන් වරද හැර ලියා මතක් කර සිටින රපෝර්තුවේ වගනම් මධ්‍යම දිසාවට අයිති ඌව වෙල්ලස්සේ අනුනායක පදවියට පත්ව සිටින බොරගල්ලේ අනුනායක ස්ථවිරයන් වහන්ෂේ අපවත් වෙන්ඩ යෙදී ..........යනුවෙන් ප්‍රාදේශීය අනුනායක පදවියක් පිරිනැමූ බව සඳහන් වේ.[34] මෙවැනි සාදක පදනම් කරගෙන නිගමනය කළ හැක්කේ ප්‍රදේශීය වශයෙන් පිරිනැමූ පදවි ද අනුනානයක යන නමින් හඳුන්වා ඇති බවය.

ප්‍රාදේශීය වශයෙන් මෙවැනි පදවියක් පිරිනැමූ අවස්ථාවක් ලෙස සඳහන් වන්නේ 1866-12-18 දින මැදගම ශ්‍රී දේවමිත්ත හිමියන්ට ගංගාරාමයේ විහාරාධිපති පදවිය සමග එහි නායක පදවියක් පිරිනැමීමයි. (එහෙත් මෙම විහාරය මල්වතු විහාරයේ පත්වන මහානායක මාහිමියන් වහන්සේ සතු විහාරස්ථානයකි) 1875-09-18 දින තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ ස්ථවිරයන්ට මාතලේ දිසාවේ නායක පදවිය ද, 1879-04-05 දින බෝතොට මේධංකර ස්ථවිරයන් වහන්සේ ඌව වෙල්ලස්සේ නායක පදවියට ද පත් කර ඇත.[35]

මින්පසු කාලවල දී ලක්දිව සෑම පළාතක්ම නියෝජනය වන පරිදි ප්‍රධාන සංඝනායක ධුරය, උපප්‍රධාන සංඝනායක ධුරය, ද්විතීය සංඝනායක ධුරය, අධිකරණ හා උපප්‍රධාන අධිකරණ සංඝනායක ධුරය යනාදි වශයෙන් නායක පදවි පත් කර ඇත. එහිදී පළාත්, දිසා, කෝරළ, පත්තු ආදි

වශයෙන් හැඳින්වෙන ප්‍රදේශයන්හි නායක තනතුරු වෙන වෙන ම පිරිනමා ඇති අයුරු දැකගත හැකිය.

**ප්‍රාදේශීය නායක පදවිවල වගකීම**

වර්තමානයේ ප්‍රාදේශීය වශයෙන් පත්වන සියලු ම නායක හිමිවරුන්ට පැවරෙන වගකීම් සමුදායක් ද ඇත. ඒ පිළිබඳ සියලු තොරතුරු පිළිගන්වනු ලබන සන්නස් පත්‍රය තුළ ඇතුළත් කර නොමැත. ඒ අනුව මෙහි සඳහන් කරනුයේ එකී වගකීම් පිළිබඳ විස්තරයකි. මෙකී වගකීම් ඉටුකරන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ කෙරෙහි මහාවිහාර පාර්ශ්වයට අයත් සෑම භික්ෂූන්ගේ ද සහයෝගය අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් ම පුරාණ චාරිත්‍රානුකූල පිළිවෙත් හා ගරු නම්බු නාමය උන්වහන්සේලා කෙරෙහි අත්‍යවශ්‍යයෙන් ම පවත්වන ලෙසට කාරක සංඝ සභා මගින් සංඝාඥා නිකුත් කර ඇත.[36] මුල්කාලයේ මෙකී සන්නස් පත්‍රයේ මහානායක, අනුනායක, කාරක සංඝ සභා නියෝජිතයන් හා රදලවරුන් කිහිප දෙනෙක් විසින් ම අත්සන් යොදන ලද නමුත් වර්තමානයේ මෙහි අත්සන් තබනු ලබන්නේ පාර්ශ්වයේ මහානායක මාහිමියාණන් වහන්සේ පමණි. ඒ අනුව පිරිනමන ලද සන්නස් පත්‍ර ප්‍රකාරව හා දැනට පවත්නා වගකීම් අනුව ප්‍රාදේශීය නායක හිමියන්ට අයත් කාර්යභාරය පහත සඳහන් පරිදි වේ.

1. ස්වකීය පාර්ශ්වයට පක්ෂපාතීව කටයුතු කිරීම

ප්‍රධාන වශයෙන් ම අභිනවයෙන් නායක තනතුරකට පත්වන ස්ථවිරයන් වහන්සේ තමන්ට අයත් පාර්ශ්වයේ ගරුත්වය ආරක්ෂා වන පරිදි ක්‍රියා කළ යුතුය. මල්වතු මහාවිහාරයෙන් පිරිනමන ශ්‍රී සන්නස් පත්‍රවල සඳහන් වන්නේ ''අපේ කැමැත්ත තිබෙන තුරු එම ධුරයේ කටයුතු සිද්ධ කරන ලෙස'' යනුවෙන් සඳහන් වීමෙන් පෙනීයන්නේ නියමාකාරයෙන් නායක පදවියේ කටයුතු සිදු නොකරන්නේ නම් නායක පදවි අවලංගු කිරීමේ බලය ද කාරක සංඝ සභාව සතු බවය.[37]

2. ප්‍රාදේශීය ශාසනික කටයුතුවල මුල්තැන් ගැනීම

තම ප්‍රදේශය තුළ ශාසනික, ආගමික කටයුත්තක් යෙදී ඇති අවස්ථාවක දී තම පාර්ශ්වයේ වගකිව යුතු තෙර නමක් නොමැති විට දී එහි මූලිකත්වය ගෙන කටයුතු කිරීමේ වගකීම පලාත් නායක මාහිමියන්ට පැවරේ. එහිදී තම විහාර පාර්ශ්වය නියෝජනය කිරීම උන්වහන්සේ සතු කාර්යයකි.

3. දුෂ්ප්‍රතිපත්ති භික්ෂූන් පිළිබඳ මහාවිහාරයට දැනුම් දීම

යම් විහාරස්ථායක භික්ෂූන් වහන්සේ නමක් විනය විරෝධි ක්‍රියාවන් හි යෙදෙමින් දුෂ්ප්‍රතිපත්තියෙන් යුක්ත ව කටයුතු සිදු කරන්නේ නම් එම දුෂ්ප්‍රතිපත්ති අත්හරවා පිළිවෙතෙහි හැසුරුවීම හා ඊට ධර්ම විනයානුකූල කරුණු කියා දෙමින් අවවාද අනුශාසනා දීම ද සිදුකළ යුතුය. එවැනි දුෂ්ප්‍රතිපත්ති ක්‍රියාවන් හි යෙදෙන භික්ෂූන් පිළිබඳ ව මහානායක මාහිමියාණන් ප්‍රමුඛ සානුනායක ගරුතර කාරක සංඝ සභාව දැනුවත් කිරීම නායක පදවි ලත් ස්වාමීන්ද්‍රයන්ගේ වගකීමක් වේ.

4. විහාරාධිපති පදවියට සුදුස්සෙකු තේරීම

තමන්ට අයත් ප්‍රදේශය තුළ ඇති විහාරස්ථානයන්හි අධිපතිකම සම්බන්ධයෙන් ගැටලු ඇති අවස්ථාවන්හි එහි මූලිකත්වය ගෙන කටයුතු කොට ඒ සඳහා සුදුස්සා පත් කොට තමන්ට අයත් පාර්ශ්වයට දැන්වීම නායක හිමියන්ට පැවරෙන රාජකාරියකි. විහාරාධිපතිකම සමබ්න්ධයෙන් දෙපාර්ශ්වයක් හෝ ඊට වැඩි පාර්ශ්වයක් අතර ඇති ව මතගැටුම් නිරාකරණය කිරීම සිදුකළ යුතුය. මෙහි දී විශේෂයෙන් ම අධිකරණ සංඝනායක හිමියන්ගේ භූමිකාව වැදගත් වේ. අනෙකුත් පළාත් නායක හිමිවරුන් ද මෙවැනි දේ සන්සිඳුවීඹට කරුණු කාරණා ඉදිරිපත් කළ යුතුය.

5. සාමණේරවරුන් රජයේ ලියාපදිංචි කිරීම

විහාරස්ථානයක යම්කිසි සාමණේර නමක් පැවිදි කළ පසු රජුයේ ලියාපදිංචි කිරීම වර්තමානයේ අනිවාර්ය අංගයකි. එහිදී පැවිදි කිරීම සම්බන්ධයෙන් තොරතුරු දන්නේ පළාතේ නායක ස්වාමීන් වහන්සේ බැවින් එකී සාමණේර නම ලියාපදිංචි කිරීම සඳහා ලිපි ලේඛන සැපයීම, පාර්ශ්වය වෙනුවෙන් එය තහවුරු කිරීම නායක ස්වාමීන් වහන්සේගේ වගකීමක් වේ. මෙම ක්‍රමය මුල් කාලයේ පාර්ශ්වයේ මහානායක මාහිමියාණන් විසින් සිදු කළත් වර්තමානයේ එය පළාත් නායක ස්වාමීන් වහන්සේට පවරා ඇත. එහෙත් යම්කිසි භික්ෂුවක් පැවිදි වී වසර පහකට වැඩි ප්‍රමාණයක් ගත වී ඇත් නම් එසේ ලියාපදිංචි කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් කරුණු දක්වා පාර්ශ්වයට දැනුම් දීම උන්වහන්සේ විසින් සිදුකළ යුතුය. (සාමණේරයන්ගේ ආචාර්යයන් වහන්සේගේ ලිපිය ද අවශ්‍යය) ඉන්පසු මහානායක මාහිමියාණන්ගේ අනුදැනුම ඇතිව එකී සාමණේර නමගේ ලියාපදිංචි සිදු කරනු ඇත.

6. උපසම්පදාපේක්ෂකින් ඒ සඳහා සුදු බව නිර්දේශ කිරීම

විසිවයස් සම්පූර්ණ වූ සාමණේර නමකගේ උපසම්පදා විනය කර්මයක් යෙදුණු අවස්ථාවන්හි දී පළතේ නායක හිමියන් විසින් එය තහවුරු කිරීම සිදුකළයුතුය. එකී තහවුරු කිරීම මත උපසම්පදා විනය කර්මය සිදුකරනු ලබයි. එහි දී උපසම්පදාපේක්ෂකයාගේ ආචාර්යවරු, උන්වහන්සේලා විහාරාධිපතිත්වය දරණ විහාර ආදිය පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීම, උපසම්පදාව සිදු කරදෙන ලෙස මහානාහිමියන් ප්‍රමුඛ සානුනායක කාරක සංඝ සභාවෙන් ඉල්ලා සිටීම හා උපසම්පදාවට සුදුසු බව දන්වා ලිපි ලබාදිය යුතුය.

7. විදෙස්ගත වන අයට ලිපි දීම

තම බල ප්‍රදේශයට අයත් යමකිසි භික්ෂුවක් විදෙස් ගත වන අවස්ථාවේ දී ඒ සඳහා අනුමැතියක් ලබාදෙන ලෙස ඉල්ලා මහාවිහාරයට දැනුම්දීමේ දී පළාත් නායක ස්වාමීන්දයන්ගේ අනුමැතිය ද අනිවාර්ය වේ. එකී ලිපිවලට අනුව මහාවිහාරයෙන් අනුමැති ලිපි ලබාදීම සිදු කරනු ලබයි. අස්ගිරි මහාවිහාරයේ දෙකී වගකීම පත්කරනු ලබන්නේ දිස්ත්‍රික්කයකට එක් තෙරනමකි. ඒ පිළිබඳ ව සන්නස් පත්‍රයෙහි ම සඳහන් කිරීම සිදු කරනු ලබයි.

8. උපැවිදි වූවන් සහතික කිරීම

උපැවිදි වූ කෙනෙක් තම උපැවිදි සහතික සකස් කර ගැනීමේ දී පළාතේ නායක හිමියන්ගේ ලිපිය අනිවාර්ය බැවින් ඒ සඳහා ද ලිපි නිකුත් කිරීම පළාත් නායක ස්වාමීන්ද්‍රයන්ගේ වගකීමකි. මෙහි දී උපැවිදි වූ බව තහවුරු කර ගැනීමට අවශ්‍ය තොරතුරු උන්වහන්සේ විසින් දැනගෙන සිටිය යුතුය.

9. ශිෂ්‍යභාවය අහෝසි කිරීම

යම් භික්ෂුවක් ආචාර්ය උපාධ්‍යායන්ට සුවච ව කීකරුව නොවසන්නේ නම් එකී භික්ෂුවගේ ශිෂ්‍ය භාවය අහෝසි කිරීමේ දී පළාත් නායක හිමියන්ගේ ලිපිය අනිවාර්ය වේ. උන්වහන්සේ විසින් එකී කරුණු සොයා බලා සත්‍ය වශයෙන් ම එබඳු ශිෂ්‍ය භාවයක් අහෝසි කළයුතුනම් ධර්මයට විනයට ගැලපෙන ආකාරයට එය සිදු කළ යුතුය. එහිදී මහාවිහාරය දැනුවත් කිරීම නායක ස්වාමීන්ද්‍රයන්ගේ වගකීමකි.

10. ශිෂ්‍ය භාවයට ඇතුළත් කිරීම

යම් විහාරස්ථායක අවශ්‍යතාවය මත සුපේශල ශික්ෂාකාමී භික්ෂුවක් එකී විහාරස්ථානයේ විහාරාධිපතිගේ කැමැත්ත පරිදි ශිෂ්‍ය භාවයට ඇතුළත් කිරීමට කැමැත්ත පළකරන අවස්ථාවක දී ඒ පිළිබඳ ව නායක ස්වාමීන්ද්‍රයන්ගේ ද කැමැත් අවශ්‍ය බැවින් ඒ සඳහා මහාවිහාරයට දැනුම් දීම ප්‍රාදේශීය නායක හිමියන්ට සිදු කළ හැකිය.

11. විහාරස්ථාන ආරවුල් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම

යම් විහාරස්ථානයක සිටින භික්ෂූන් වහන්සේලා අතර ඇතිවන ගැටලු නිරාකරණය කිරීමට නොහැකි අවස්ථාවක දී එහි වගකීම පැවරෙන්නේ පළාතේ අධිකරන සංඝනායක හිමියන්ටය. පළාත්වාසී අනෙකුත් නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා සමග සාකච්ඡා කොට එකී ගැටලු නිරාකරණය කළයුතුය. එසේ නිරාකරණය කොට සම්පූර්ණ වාර්තාවක් සකසා මහාවිහාරයට දැනුම් දීම පත්කරන නායක හිමිවරුන්ගේ වගකීමක් වේ. පලාත්වාසී නායක හිමිවරුන්ට විසඳාගත නොහැකි වුවහොත් එය මහාවිහාරයට දන්වා සිටීම ද කළයුතුය. එසේම විහාරස්ථානයට අයත් දායකයන්ගෙන් ඇතිවන ගැටලු අවස්ථාවක දී ද මෙවැනි ම පිළිවෙතක් අනුගමනය කළ යුතුය. එහිදී ප්‍රාදේශීය භික්ෂූන්ගේ අත්සන් ලේඛන, දායක සභාවන්හි අත්සන් ලේඛන, ප්‍රාදේශීය ලේකම්ගේ සහතික, ග්‍රාම නිලධාරිගේ සහතිකය ආදිය ද මීට ඇතුළත් කළයුතු වේ.

(ඉහත කී කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය නායක හිමියන්ගේ සහතිකයට අමතරව තවත් ලිපි ලේඛන ඇතුළත් වියයුතුය. උදා:- අවශ්‍ය කරුණ සම්බන්ධයෙන් අදාළ කෙනාගේ ඉල්ලීම් ලිපිය, ප්‍රාදේශීය ලේකම් සහතිකය, ග්‍රමසේවා සහතිකය, සාමණේර හෝ උපසම්පදා සහතික, විහාරාධිපති පදවියක් නම් පැවිදි සහෝදරයන්ගේ කැමැත්ත සහිත ලිපි, විදෙස් ගමනක් නම් අනුග්‍රහ දක්වන්නන්ගේ ලිපි, උපැවිදි වීනම් ආචාර්යයන් වහන්සේගේ ලිපිය ආදි සියල්ලක් ම ඇතුළත් විය යුතු බව සලකන්න)

මේ ආකාරයට ස්‍යාමෝපසම්දාව පිහිටුවීමෙන් පසු සංඝ සංස්ථාව තුළ නන්විධ නායක පදවි පිරිනමා ඇති ආකාරය දැකගත හැකිය. මුලදී පත්කළ සංඝරාජ, මහානායක, අනුනායක පදවිවලට

අමතර ව එහි වර්ධනීය අවස්ථා කලින් කලට සිදුවූ අයුරු ද දැකගත හැකිය. මීට අමතරව 'නායක' යන නමින් දක්නට නොතිබුණත් ඒ ඒ කාලවල ඇති වූ අවශ්‍යතා මත උපාධ්‍යාය, කර්මාචාර්ය වැනි පදවි ද පසුකාලීනව පිරිනමා ඇති අයුරු දැකගත හැකිය.

ආන්තික සටහන්

---

[1] ම. ව., පරි. 95, ගා. 10 - 15, පි. 592 -593.
ස්‍යාමෝපසම්පදාවත, සංස්. හග්ගමුවේ සිරි රතනාලංකාර හිමි, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 1998, 55 පිට.

[2] වාචිස්සර හිමි, කොටගම, සරණංකර සංඝරාජ සමය, 57 පිට.

[3] වාචිස්සර හිමි, කොටගම, සරණංකර සංඝරාජ සමය, 50, 54 පිටු.

[4] මෙම සූරියගොඩ තෙරණුවෝ පසුකලෙක සාමණේර භූමියට පත්ව සිට ගස්කොන් අදිකාරමගේ සිද්ධියේ දී නරේන්ද්‍රසිංහ රජුගේ අණින් හිස්ගැසුම් කැහ. ඒ බව පසු කලෙක සරණංකර සංඝරාජයන් විසින් ලියන ලද ලිපියකින් පැහැදිලි වෙයි.
සංඝරාජසාධුචරියාව, ප්‍රස්තාවනාව බලන්න.

[5] සංඝරාජසාධුචරියාව,

[6] සංඝරාජසාධුචරියාව, පි. 5

[7] මන්දාරම් පුර පුවත, සංස්. ලබුගම ලංකානන්ද හිමි, ලංකා විශ්වවිද්‍යාලය, 1958, 559-571 කවි, 74-76 පිටු.

[8] Memoir of Joan Gideon Loten 1752-1757 (Colombo) 1935, pp.6

[9] ස්‍යාමෝපසම්පදාවත, සංස්. හග්ගමුවේ සිරි රතනාලංකාර හිමි, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 1998, 59 පිට.

[10] මන්දාරම් පුර පුවත, සංස්. ලබුගම ලංකානන්ද හිමි, ලංකා විශ්වවිද්‍යාලය, 1958, 702-703 කවි, 93 පිට.

[11] වාචිස්සර හිමි, කොටගම, සරණංකර සංඝරාජ සමය, 185 පිට.

[12] ස්‍යාමෝපසම්පදාවත, සංස්. හග්ගමුවේ සිරි රතනාලංකාර හිමි, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 1998, සංඥාපනය බලන්න.

[13] මන්දාරම් පුර පුවත, සංස්. ලබුගම ලංකානන්ද හිමි, ලංකා විශ්වවිද්‍යාලය, 1958, ප්‍රස්තාවනාව බලන්න. ix

[14] වාචිස්සර හිමි, කොටගම, සරණංකර සංඝරාජ සමය, 208, 209 පිටු.

[15]**ARCHAEOLOGICAL DEPARTMENT CENTENARY (1890-1990) COMMEMORATIVE SERIES**, VOL.III, EDITOR- CN- CHLEF PANDIT DR. NANDADEVA WEJESEKARA- Printed at the state printing corporation Padukka, 1990. P.85.

[16] GA. OF THE CE. PR. OF CEY. Vol ii P.532.

[17] ස්‍යාමෝපසම්පදාවත, සංස්. හග්ගමුවේ සිරි රතනාලංකාර හිමි, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 1998, 65 පිට.

[18] ස්‍යාමෝපසම්පදාවත, සංස්. හග්ගමුවේ සිරි රතනාලංකාර හිමි, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන, 1998, 63 පිට.

[19] මන්දාරම් පුර පුවත, සංස්. ලබුගම ලංකානන්ද හිමි, ලංකා විශ්වවිද්‍යාලය, 1958, 715 කවිය, 95 පිට.

[20] මන්දාරම් පුර පුවත, සංස්. ලබුගම ලංකානන්ද හිමි, ලංකා විශ්වවිද්‍යාලය, 1958, 719, 721 කවි, 95 පිට.

[21] වාචිස්සර හිමි, කොටගම, සරණංකර සංඝරාජ සමය, 273 පිට.

[22] රාජ්‍ය ලේඛනාගාර පිටපත 15 5/63/157/1

[23] රාජ්‍ය ලේඛනාගාර පිටපත 15 5/63/157/1

[24] රාජ්‍ය ලේඛනාගාර පිටපත 15 5/63/157/II

[25] රාජ්‍ය ලේඛනාගාර පිටපත 5/63/159/44

[26] මල්වතු මහාවිහාරයේ අතිගරු තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහානායක මාහිමියන්ට ප්‍රදානය කරන ලද සන්නස් පත්‍රයෙන් උපුටා ගන්නා ලදි

[27] අස්ගිරි මහාවිහාරයේ උඩුගම බුද්ධරක්ඛිත මහානායක මාහිමියන්ට පිරිනමන ලද සන්නසෙන් උපුටා ගන්නා ලදි.

[28] මල්වතු මහාවිහාර සංඝ පරම්පරාව, තිබ්බටුවාවේ ශ්‍රී සුමංගල අනුනායක පදවිය පිරිනැමීම වෙනුවෙන් බෞද්ධ කටයුතු දෙපාර්තුමේන්තුව මගින් කරන ලද කලාපය, 1992, 4 පිට.

[29] සඟරජවත, සංස්. ශ්‍රී චාල් ද සිල්වා, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1955, 188 පද්‍යය, 96 පිට.

[30] සඟරජවත, සංස්. ශ්‍රී චාල් ද සිල්වා, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1955, 188 පද්‍යය, 96 පිට.

[31] සීලක්ඛන්ධ හිමි, තුඹුල්ලේ, අස්ගිරි මහාවිහාරයෙහි ප්‍රභවය, විකාශය හා තදනුබද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1996, 159 පිට.

[32] අස්ගිරි විහාරයෙහි ලේඛකාධිකාරී හිමියන් සමග කළ සාකච්ඡාවකින් පසු ඇතුළත් කොට ඇත.

[33] මල්වතු මහාවිහාරයෙහි අඹන්වැල්ලේ පන්සලේ ඇති පැරණි ලිපි

[34] මල්වතු මහාවිහාරයෙහි අඹන්වැල්ලේ පන්සලේ ඇති පැරණි ලිපි

[35] රාජ්‍ය ලේඛනාගාර පිටපත 15 5/63/157/II

[36] මල්වතු මහාවිහාරය මගින් දෙනු ලබන ශ්‍රී සන්නස් පත්‍රයෙන් උපුටා ගන්නා ලදි.

[37] හිරියාලහත්පත්තුවේ උපප්‍රධාන සංඝනායක තනතුරක් අවලංගු කළ අවස්ථාවක් පිළිබඳ තොරතුරු අසා ඇත. පුද්ගල හානියක් හෝ අපහාසයක් සිදුවේය යන හැඟීමෙන් එකී වර්ෂ හා නම් ගම් සඳහන් නොකරමු.

මල්වතු විහාරවාසී, අනුරාධපුර බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයන අංශයේ ආධුනික කථිකාචාර්ය රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, වැලිවිට සොරත හිමි